2020 8. 25 දිනමිණ

2

# ජූලි මාසයේ උද්ධමනය අඩු වෙලා

**ජයසිරි මුණසිංහ**

මේ වසරේ ජූනි මාසයට වඩා ජූලි මාසයේ උද්ධමනය සියයට දශම දෙකකින් අඩුවී ඇතැයි ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රකාශ කරයි.

ජූලි මාසයේ සියයට 6.3 ක් වූ උද්ධමනය ජූලි මාසයේදී සියයට 6.1 දක්වා අඩුවී ඇත. එළවළු, රතුළූනු, දෙහි සහ සහල් ආදී ආහාර කාණ්ඩයන්හී මිල ගණන් පහළ යාම උද්ධමනය අඩුවීමට හේතුවී තිබේ.

ආහාර කාණ්ඩයෙහි මිල ගණන් අඩුවූවද ආහාර නොවන කාණ්ඩයන්හි මිල ගණන් ඉහළයාම සිදුවුවද මෙය තුලනය කරමින් උද්ධමනය පහළ යාමක් වාර්තා කරන බව ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව උපුටා දක්වමින් මහ බැංකුව සඳහන් කර සිටියි.